

මාතලේ මැටිහක්ක ගොවිපළ

අතිරේක ආහාර ද්‍රව්‍යයන් නිපදවීමේ සටනට ඉදිරිපත්වී සිටින තවත් ඡන්ද කොට්ඨාශ ගොවිපළක් බැලීමට අපි මෙවර මාතලේ දිස්ත්‍රික්කයට ගියෙමු. ලග්ගල ඡන්ද කොට්ඨාශය තුළ නක්ල්ස් කඳු සෙවනෙහි සශ්‍රීක පිටිසර ගම්මානයක පිහිටි මැටිහක්ක ගොවිපළ එලෙස ආහාර නිපදවීමේ ව්‍යාපාරයට බැස සිටින අතර එය ප්‍රදේශයේ පිටිසර ගොවීන්ගේ ආර්ථික තත්ත්වය නගාලීමට ද උපකාරවී ඇති බව අප පළමුවෙන්ම වටහාගත් දෙයයි. රමණීය සොබා සිරියකින් හෙබි මැටිහක්ක ගම් ප්‍රදේශය අවට රබර්, පොල් ආදී ස්ථාවර බෝගයන් වගාකර ඇති වතු කරය නිසා ගමනා ගමන පහසුකම් බොහෝ දුරට සැලසී ඇතත් ගම් වාසින්ගේ ආර්ථික තත්ත්වය එතරම් සතුටුදායකව නැත්තේ ඔවුන් සතු ඉඩම් ප්‍රමාණය බෙහෙවින් සුළු හෙයිනි. එසේ හෙයින් මාතලේ දිස්ත්‍රික්කයේ ආරම්භ කරන ලද ඡන්ද කොට්ඨාශ ගොවිපළ් මාලාවෙන් එකක්වන මෙම ගොවිපළ පිහිටුවන ලද්දේ රජයෙන් ලබා ගත් ඉඩම් අක්කර $11\frac{1}{2}$ ක පමණ කැළෑ තුඩුවකය.

ළපටි එළවළු පැළවලට සත්කාර

1961 වර්ෂ අවසානයේදී මෙවැනි ගොවිපළ් පිහිටුවීමේ මූලික පියවරයන් සමඟ මැටිහක්ක ගොවිපළ ඇති කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. ඒ අනුව එම අවුරුද්දේ නොවැම්බර් මාසයේ ගමේ ඉඩම් නොමැති, ගොවිතැනට උනන්දු, දක්ෂ ගොවීන් 25 දෙනෙකු තෝරා, මාතලේ එවකට දිසාපතිව සිටි උපාලි ගුණරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පවත්වා "මැටිහක්ක ඡන්ද කොට්ඨාශ සමුපකාර ගොවි සමිතිය" යන නමින් සමිතියක් අරඹා, ලියාපදිංචි කරන ලදී. තදනන්තරව එක් අයෙකුට අක්කර $\frac{1}{2}$ක් පමණ වැටෙන සේ ඉඩම් කැබලි කර බෙදා දෙන ලද්දේය.

මීට ඉහතින් පළවූ කලාප දෙකේ විස්තර කෙරුණු ගොවිපළ් දෙකට වෙනස් විශේෂාංගයක් මැටිහක්ක ගොවිපළේ තිබෙන බව මීළඟට සඳහන් කළ යුතුව තිබේ. ඇල්පිටිකන්ද හා යහමුල්ල ගොවිපළ්වලට සාමාජිකයින් තෝරා තිබෙන්නේ තරුණ ගොවි සමාජවලින්ය. නමුත් මැටිහක්ක ගොවිපළ් සමිතියට සාමාජිකයින් තෝරා ගන්නා ලද්දේ, ගමේ ඉඩම් නොමැති වැඩිහිටි ගොවීන් අතුරින්ය. ඇල්පිටිකන්ද ගොවිපළේ සාමාජික තරුණ ගොවීන් ගොවිපළේ සියළු කටයුතු සාමූහිකව ඉටු කරති. යහමුල්ල ගොවිපළේ සාමාජිකයින් තරුණ ගොවීන්වන නමුදු ඔවුන් වැඩ කරන්නේ බෙදාගත් ඉඩම් කොටස්වලය. ඒ අතර මැටිහක්ක ගොවිපළේ සාමාජිකයින් වැඩිහිටි ගොවීන් අතුරින් තෝරා සිටිනවා පමණක් නොව ඔවුන් වැඩ කරන්නේද බෙදාගත් ඉඩම් කැබලිවලය. ඡන්ද කොට්ඨාශ ගොවිපළ් මාලාව, ඒවා පිහිටුවා ඇති ප්‍රදේශයන් අනුව නොයෙකුත් විධිවලට සංවිධානය වී තිබෙන බව මෙයින් පෙන්නුම් කෙරේ.

1962කේ යල් කන්නයට බෝග වගාවී තුබූ අවස්ථාවේ මෙම ගොවිපළට අපේ ගමන සිදුවූයෙන් අප දුටුවේ නෙත් සිත් පිනවන දර්ශනයකි. නොයෙකුත් උඩරට හා පහත

පස සංරක්ෂණය ගොවිපළේ වටිනා කාර්යයකි

රට එළවළු වර්ගයන් ඒ වායේ විවිධ අවස්ථාවන්හී වගා වෙමින් පැවතුණි. බටු, මිරිස්, කරවිල, වැටකොළු, බණ්ඩක්කා, බොංචි, රතුඑනු ආදිය පමණක් නොව, බීට්, ලීක්ස් ආදී උඩරට එළවළු වර්ගයන් පවා සාරවත් ලෙස වැඩී තිබුණි. ඒ අතර ඵලබරින් යුත් කෙසෙල්, පැපොල් ආදී පළතුරු වර්ගයන්ගේ ගස්, විශාල සංඛ්‍යාව හේතුකොටගෙන ගොවිපළේ සිරිය තව දුරටත් උසස් වීය. ගොවිපළ නැරඹීමට අප කැඳවා ගිය මාතලේ දිස්ත්‍රික්ක කෘෂිකර්ම ව්‍යාප්ත නිලධාරි ඩී. බී. ද සිල්වා මහතාගේ මුහුණ ගොවිපළට පා තබත්ම ප්‍රීතියෙන් පිනායනවා අප දුටුවේ එතරම් විශ්මයකින් නොවේ. බොහෝ වෙහෙස මහන්සියෙන් හදා වඩා ගත් දරුවකු තමා සිතූ පැතූ ප්‍රමාණයද ඉක්මවා හොඳින් දියුණු වන්නා දකින පියෙකු ප්‍රීතියෙන් පිනා යන්නේ යම්සේද, සිල්වා මහතාද සැමවිට මැටිහක්ක ගොවිපළට පා නගන විට එයාකාරයෙන් ප්‍රීතිමත් වන බව පළාතේ ගොවිකම් ව්‍යාප්ති නිලධාරි සී. ඇස්. දිසානායක මහතා අප සමඟ කීහ.

මැටිහක්ක ගොවිපළේ ප්‍රගතිය, දිසානායක මහතා තවදුරටත් විස්තර කළේ මෙසේය :—

"ගොවිපළ ආරම්භයේ සිටම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහ ඉඩම් දෙපාර්තමේන්තුවේ ද සම්පූර්ණ සහයෝගය, ආදර්ශ හා උපදෙස් අඩු නොමැතිව ලැබුණි. එම නිසාම පස සංරක්ෂණය, සුදුසු බෝග තෝරා ගැනීම, පෝර යෙදීම යනාදිය ක්‍රමානුකූලව කර ගැනීම උගහට නොවීය".

1961/62 මාස් මෝසම එළඹෙනවිට ගොවීහු ඉතා උනන්දුවෙන් ඉඩම් හෙළිපෙහෙළි කර ශුඛකොට සමෝච්ච ක්‍රමයට කානු, ගල්වැටි, පස් කන්ඩි යනාදී ඉදිකර පස සකස් කර තුබූ බැවින්, තෝරාගත් බෝග, පහසුව වවාගත හැකි විය. වම්බටු, මිරිස්, එනු,

2**—ආර් 10973 (63/7)

වැටකොළු බණ්ඩක්කා යනාදී එළවළු වර්ගයන් මෙන්ම සුදුසු ස්ථානවල බෝංචි, බීට්, ලීක්ස් ආදී උඩරට එළවළුද වවා සාර්ථක ප්‍රතිඵල ලබා ගත්හ. එම මාස් කන්නයේදී පමණක් ඔවුන් ලත් ආදායම රුපියල් 9,798.00කි.

පළාතේ පොදු ජනතාවගේ මෙන්ම රජයේ සෑම දෙපාර්තමේන්තුවකින්ම නොමසුරු ආධාර සහ සහයෝගය ගොවිපළ ආරම්භයේ සිට නෙකඩවා ලැබුණු හෙයින් සෑම කටයුත්තක්ම ඉතාමත් පහසුවෙන් කරගත හැකි විය. මාද ගොවිපළට නිතර ඇවිත් අවශ්‍ය උපදෙස් ගොවි සාමාජිකයින්ට සැපයුයේ ඔවුන් වහා දියුණුව කරා රැගෙන යන ආශාවෙන්ය. එපමණක්ද නොව, විටින් විට වගාව සඳහා ගොවීන්හට බීජ වර්ගයන්ද නොමිලේ සැපයීමට මට හැකිවීම ගැන මා විශෙෂයෙන් සතුටු වෙමි. මාතලේ දිස්ත්‍රික්ක කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරී ඩී. බී. ද සිල්වා මහතාද එසේම ගොවිපළට පැමිණ, සෑම අඩුලුහුඬුවක් ගැනම සොයා බලා ඊට අවශ්‍ය ප්‍රතිකර්ම හා උපදෙස් දී ගොවීන්හට සහාය වුණි. මෙහි නිතර නිතර පැමිණෙන තවත් අයෙකු සිටී. ඔහු අන් කෙනෙකු නොව ලග්ගල මහජන මන්ත්‍රී කේ. ඇම්. කේ. බණ්ඩා මහතාය. ගොවිපළේ ශුභසිඛිය සෑමවිටම පතන මන්ත්‍රීතුමා, එහි දියුණුව සඳහා හැකි සෑම ආධාරයක්ම දීමට පොරොන්දු වී ඇත.

ගොවිපළේ ප්‍රගතිය ගැන අසා සතුටට පත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඒවකට අතිරේක සභිර ලේකම් මහතා, කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ ද කැටුව මැවිහක්ක ගොවිපළ නැරඹීමට පැමිණියේය. ගොවිපළේ ප්‍රගතිය ගැන බෙහෙවින් සතුටුවූ එම දෙපළ, විශෙෂයෙන්ම තුටුවූයේ ගොවිපළේ පළමු කන්නයේ නෙලාගන්නා ලද මාළු මිරිස් අස්වැන්න රාත්තල රු. 1 සිට 1.30 දක්වා මිළකට සමුපකාර දෙපාර්තමේන්තුවේ

ව්‍යාප්ති නිලධාරී මහතුන් වගා උපදෙස් සපයති

හා වෙළඳ දෙපාර්තමේන්තුවේද සහාය ඇතිව අලෙවි කර ගැනීමට හැකිවූ බැව් ඇසීමෙන් බව මා සාඩම්බරයෙන් සඳහන් කිරීමට කැමැත්තෙමි. මෙම දෙපළ සමඟ පැමිණි රජයේ වෙනත් නිලධාරීන්ද, ගොවිපළේ දියුණුව ගැන ඉමහත් ලෙස ප්‍රීතියට පත් වූහ. ගොවිපළට තවත් අක්කර 10ක් පමණ යුත් ඉඩම් කැබෙල්ලක් ලබා දීමට අතිරේක සභිර ලේකම් මහතා පොරොන්දු වූයේ සාමාජික ගොවීන් මෙතෙක් කර ඇති වැඩ ගැන පැහැදීමේ ප්‍රතිඵලයක් වශයෙනි."

ගොවිතැන් සාර්ථක කර ගැනීමට සැහෙන තරම් ජල පහසුකම් තිබිය යුතුවේ. කලට වේලාවට වතුර නොලැබුණහොත් කෙතරම් මහන්සියකින් වැඩ කළත් එහි ප්‍රතිඵල එතරම් සතුටුදායක නොවේ. එනිසා මෙම ගොවීහු වතුර ගැනම බලා නොසිට, තවාන් හා වැඩෙන පැළවලට වතුර දැමීමටත්, සාමාජිකයින්ගේ දවසේ වැඩ අවසානයේදී ඇඟ සේදීම හා දිය නෑම ආදී ප්‍රයෝජනයන් පිණිසත්, දැනට ලින් දෙකක් කපා කලු ගලින් බැඳ තිබේ. අඩි 10ක් 12ක් ගැඹුරුති මෙම ලින් නිතර උතුරා යන තරම් දිය පිරී ඇති අතර ගොවිපළේ සැහෙන කොටසකට වතුර සැපයීමට පහසු අයුරු පිහිටා තිබේ. ගොවිපළට අවශ්‍ය සම්පූර්ණ ජල පහසුකම් ලැබෙන පරිදි තව ලින් කීපයක් කපා ගැනීමට ගොවීහු තවදුරටත් අදහස් කරගෙන සිටිති.

මැටිහක්ක ගොවිපළ ශීඝ්‍රයෙන් දියුණුකර ගැනීම සඳහා සැමවිට එහි කායර්‍ය මාලාව වහා ඉටු කර ගැනීමට සාමාජික ගොවීන්ට නිසි උපදෙස් හා උපකාර සපයන්නේ කොට්ඨාශයේ ආහර නිෂ්පාදන ඕවර්සියර් ඩබ්ලිව්. ඇම්. යු. බණ්ඩා මහතාය. එක් එක් ගොවියා වෙනුවෙන් වෙන් කෙරුණු බිම් කැබලි මායිම් කිරීම සඳහා වැටවල් දිගේ සිටුවීමට මුරුංගා කැබලි නොමිලේ පරිත්‍යාග කරන ලද්දේ බණ්ඩා මහතා විසිනි. එපමණක්ද නොව දැනට කපා ඇති ලින් අසල සිටුවීම සඳහා කොහිල දඬුද ඔහුගෙන්ම ගොවීන්හට ලැබුණ ත්‍යාගයකි. මුරුංගා හා කොහිල යන දෙවර්ගයම හොඳින් වැඩී තිබෙන බව අපි එහිදී දුටිමු.

(123 පිට හා සම්බන්ධයි)

ගොවිපළේ වැඩ හමාරවූ විට ගොවීහු දිය නාති